මාධ්‍ය නිවේදන - අංක **54**

## මැතිවරණ කොමිෂන් සභාව

## පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05

### ඡන්ද පොළේ දී ඡන්දදායකයින්ගේ අනන්‍යතාව තහවුරු කිරීම

2020 වර්ෂයේ අගෝස්තු මස 05 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්දදායකයින් විසින් තම අනන්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි.

02. ඒ අනුව ඡන්දදායකයින් විසින් සිය ඡන්දය ප්‍රකාශ කිරීමේ දී;

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු රියදුරු බලපත්‍රය
- රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත
- වැඩිහිටි හැඳුනුම්පත
- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද පූජ්‍ය/ පූජක හැඳුනුම්පත
- 2020 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන "ජාතික හැඳුනුම්පතේ තහවුරු කිරීමේ ලිපිය"

යන ලියවිලි අතුරින් එකක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

03. ඉහත සඳහන් කවර හෝ වලංගු හැඳුනුම්පතක් නොමැති ඡන්ද හිමියන්ට අදාළ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී/ වතු අධිකාරී මගින්, මැතිවරණ කොමිෂන් සභාව නිකුත් කරන තාවකාලික හැඳුනුම්පතක් ලබාදීමට කටයුතු කරන ලෙස සියලුම තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් ලබා දී තිබේ.

04. මෙම තාවකාලික හැඳුනුම්පත අවශ්‍ය ඡන්ද හිමියන්ට අයදුම්පත් ග්‍රාම නිලධාරීන්ගෙන් ලබාගත හැකි අතර, එම අයදුම්පත් සම්පූර්ණ කර මෑතකදී ගත් කළු සුදු හෝ වර්ණ (පළල සෙ.මී. 2 ½ හා උස සෙ.මී. 3) උඩුකය ප්‍රමාණයේ ඡායාරූප පිටපත් දෙකක් ද සමග ඡන්ද විමසීමට දින හතකට, එනම් 2020.07.29 වන දිනට පෙර අදාළ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී/ වතු අධිකාරී වෙත භාරදිය යුතු ය.

05. තවද, ජාතික හැඳුනුම්පතක් ලබා ගැනීම සඳහා 2020 ජූලි මස 29 වන දින දක්වා භාර දී, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතියට ඇතුළත් කර ඇති අයදුම්පත් සඳහා නව ජාතික හැඳුනුම්පත හෝ ජාතික හැඳුනුම්පත් තොරතුරු තහවුරු කිරීමේ ලිපිය පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන බැවින්, ඔවුන් සඳහා තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය නොවන බව වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

2020.07.17